


**සිඩ්නි නුවර වෙසෙන අධිනීතිඥ මෛත්‍රී පනාගොඩ මහතා නෝට්‍රඩාම් විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකු ලෙස පසුගියදා පත්කරනු ලැබ ඇත. ගෙවනු වසර 40 ක් මුළුල්ලේ එංගලන්තයේත් ඕස්ට්‍රේලියාවේත් නීතිමය කටයුතුවල නියැලෙමින් ශ්‍රී ලාංකිකයිනට මෙන්ම විවිධ ජාතීන්ටද ඔහුගේ සේවාව ලබාදෙමින් ගෞරවාදරයට පත්වූ අයෙකි.**

**සිඩ්නි නුවර ප්‍රධාන පෙළේ පෞද්ගලික නීති සමාගමක කොටස් කරුවකු වන පනාගොඩ මහතා ශාස්ත්‍රීය අංශයෙන් නීති විෂයයන් පිළිබඳ ලිපි ලේඛන රාශියක් ලියා ඇත. එමෙන් ම කාලීන නීති ප්‍රශ්න පිළිබඳව දේශන පැවැත්වීමෙන් ඔහු ඕස්ට්‍රේලියානු නීතිඥ වෘත්තියට විසල් මෙහෙයක් කරනු ලබයි.**

**නෝට්‍රඩාම් විශ්ව විද්‍යාලය ඕස්ට්‍රේලියාවේ පැරණිතම පෞද්ගලික විශ්ව විද්‍යාලයයි. එහි ආරාධිත දේශකයෙකු ලෙස එතුමා අවුරුදු කිහිපයක් සේවය කර ඇත.**

### අධිනීතිඥ මෛත්‍රී පනාගොඩ මහතා

# මහාචාර්ය පදවි ලබයි

ඕස්ට්‍රේලියානු ආදිවාසීන් වෙනුවෙන් ඔවුනගේ අයිතීන් වෙනුවෙන් කරඇති සේවය අප්‍රමාණය. ඒවා ග්‍රන්ථාරූඪ වී තිබීම ඉතිහාසයට වැදගත් වූ ශ්‍රී ලාංකිකයකු ගේ දස්කමකි. හුරුවූ සරළ වූ දිවි පෙවතත්, සුන්දරත්වයත් එක්කොට ගෙන අපූරු නිර්මාණයන් හැඩ කරන මෙතුමා සිංහල සාහිත්‍ය කලාවේ ද, ගීතයේ ද කවියේ ද හිමැවුම් කරුවෙකි. සෞන්දර්යවාදියෙකි.

සිංහල සාහිත්‍යයට සුබාවිත ගීතයට,කවියට මෙතුමා ගේ නම එක්වන්නේ 70"දශකයේ සිටන්මය. ළමා ගී මෙන්ම, වැඩ කරන ජනතාවට පණිවුඩයක් දෙන්නට, පටන් ගන්නා උදෑසනට නව ජවයක් දෙන්නට එතුමා අතින් එදවස පබැඳි ගී අදටද ජනප්‍රියය.

> "මහාචාර්ය පදවියෙන් පිදුම් ලැබීම මා සලකන්නේ මා උපන් රට වන ශ්‍රී ලාංකාවට කරන ලද ගෞරවයක් ලෙසයි"

ප්‍රේමසිරි කේමදාසයන් අතින් සංගීතවත් වී එ දවස ජෝතිපාලයන් ගැයූ"මම යනවා මම යනවා බොල්පිණි මැඩගෙන මම යනවා" නීලා වික්‍රමසිංහ ගේ " හෙට උපදින පුංචි පුතේ" ටී.එම්.ජයරත්නයන් ගේ " පාවී පාවී මේ එන්නේ අතීතයේ සිට එන සුළඟයි" ලයනල් අල්ගමයන් ගේ සංගීතයට නිරංජලා සරෝජිනිය ගැයූ "සුදුවැලි මතුපිට දිය බිඳු ඉස ඉස" වැනි ගීත අද දවසටද එදා ගෙනදුන් මිහිරියාව ජවය ගෙනඑයි.

එතුමා මෑතක දී නිර්මාණය කල බොහෝ ගීතයන් වගේම ඉදිරියට එන්නට තිබෙනා වූ ගීතයන් ගැනද පණිවුඩය දැනගැන් ම තවත් සුබවාදී ආරංචියක්.

විදෙස් බිමෙක හිමැවෙන විදෙස් බිමෙක ඉපැදුන ශ්‍රී ලාංකික දරු දැරියන් දෙතොලට සිංහල බසක රස බෙදන්නට සමත් වූ අභිමානවත් සිංහල ළමා ගී සමුච්චය පබැඳීමේ භාගෘත් මෛත්‍රී පනාගොඩයන් හට හිමිවෙනවා.

මෑතකදී නිකුත් වූ සංගත තැටිය වූ අමරදේවයාණන් ගේ "සොදුරු වූ මිනිසා" අමර ගී රසෝඝයේ "සෙවනැළි මියයන හැන්දෑවේ"ගීයේ පද පබැඳුමෙන් ඒ සංගත තැටියටද තවත් අලංකාරයක් ගෙන එනවා වගේම ගීතයට,කවියට,නීතියට හපන් එතුමාට "නීතියයි - ගීතයයි" කියා දිනෙක මා සදහන් කල අයුරු මෙ පුවත ලියන අතරතුර සිහිවෙනවා.

"මහාචාර්ය පදවියෙන් පිදුම් ලැබීම මා සලකන්නේ මා උපන් රට වන ශ්‍රී ලාංකාවට කරන ලද ගෞරවයක් ලෙසයි" පවසනු ලැබුවා. මෛත්‍රී පනාගොඩයන් ගේ අපේකම දනවන ඒ කියමන සදාකල් මතකයේ රැඳෙනු ඇති සැමදා.

නිර්මාණ රැඳි වෙබ් අඩවියට පිවිසෙන්නට නම්

http://maithripanagoda.com/





## ජ්‍යොතිශය
## ASTROLOGY

- භාව කේන්ද්‍රය අනුව පලාපල කථනය
- කේන්ද්‍ර සෑදීම හා නැකත් සෑදීම
- පොරොන්දම් බැලීම හා විවාහ දෝෂ පරීක්ෂාකිරීම

සියළු ජ්‍යොතිශ කටයුතු සඳහා විමසන්න
ජ්‍යොතිර්වේදී
**දේවසිරි විද්‍යාරත්න** MA
90777523 / 0450 561 941


"මිනිස්සුන්ව තේරුම් ගන්න හරිම අමාරුයි. මිනිස්සු නිතරම වෙනස් වෙනවා. පස් දෙනෙක් ගත්තොත් පස් විදියක්. එකට ඉන්න ස්වාමියා - බිරිඳ ගතිගුණ අතින් එකිනෙකාට වෙනස්. එකම පවුලේ හතර දෙනා හතර විදියක්".

මේ ආකාරයේ අදහස් හා ප්‍රකාශ අපිට නිතර ඇහිලා තියෙනවා. මෙහෙම වෙන්නේ ඇයි?

අපි හරි කැමැතියි අප අවට සිටින අපිත් එක්ක වැඩ කරන පුද්ගලයන්ව තේරුම් ගන්න උත්සාහ කරනවට වඩා, එයාලා අපිව තේරුම් ගන්න උත්සාහ කරනවනම්. මොකද මේ තේරුම් ගැනීම එතරම්ම ලෙහෙසි නැති නිසා.

බොහෝම ලඟින් ඇසුරු කරපු යාලුවෝ දෙන්නෙක් හිටියා. දෙදෙනාගේ මරණයෙන් පස්සේ එක්කෙනක් ගිහිල්ලා ඉපදුනා දිව්‍යලෝකයේ. මෙයාට මුලින්ම මතකයට ආවේ තමාගේ යාලුවව. වහාම හොයලා බැලුවා දිව්‍යලෝකයේ හැම තැනම. කොහෙවත් හෙ-ායන්න බැරිවුනා. මෙයා ටිකක් කලබලත් උනා යාලුවට මොකද උනේ කියලා. දිව්‍යලෝකය හා ඒ අවට ඇති අනිත් ලෝකවල හොයාගන්න බැරිවෙච්ච තැන, මනුෂ්‍ය ලෝකයෙ ඉපදිලා ඉන්නවද කියලා බැලුවා. ඒත් නෑ. හරිම කලබලෙන් හරිම දුකෙන් තව දුරටත් හොයා බලනකොට මෙයා දැක්කා යාලුවා ඉපදිලා ඉන්නවා පනුවෙක් වෙලා ගොම ගොඩක.

මෙයාට ගොඩාක් දුක හිතුනා. ගිය ආත්මෙ එකට හිටිය හොඳම යාලුවා පනුවෙක් වෙලා ගොම ගොඩක ඉපදී සිටීම ගැන. මෙයා වහාම එතනට ගියා. ගිහින් යාලුවට කථාකලා "මම ඔයාව හැම තැනම හෙව්වා. මම ගිහිල්ලා දිව්‍යලෝකයෙ ඉපදුන ගමන් ඔයාව හොයන්න පටන්ගත්තා. එහෙ නැති නිසා අනෙක් ලෝකවල හෙව්වා. මට එන්න පරක්කු උනේ ඒකයි. හැබැයි දැන් දුක්වෙන්න එපා, දැන් ඔය ජරා ගොඩේ හිටියා ඇති. අපි යමු දිව්‍යලෝකයට. මට පුලුවනි ඔයාව එහෙට එක්කගෙන යන්න."

එතකොට අර යාලුවා අහනවා "මම මොකටද දිව්‍යලෝකේ යන්නේ? මොනවද එහෙ තියෙන්නේ? කියලා.

ඒකට උත්තර දෙන අනිත් යාලුවා කියනවා " දිව්‍යලෝකය හරිම ලස්සනයි. එහේ ඉන්න අයත් හරිම ලස්සනයි. සැප සම්පත් ඕනි තරම් තියෙනවා. අපි එහෙට ගිහිල්ලා සන්තෝෂයෙන් ඉමු" කියලා.

එතකොට අර පනුවෙක් වෙලා ඉන්න යාලුවා අහනවා "එහේ දිව්‍යලෝකයේ ගොම තියෙනවද?" කියලා.

අනිත් යාලුවාට හොඳටම තරහ ගියා " දිව්‍යලෝකයේ කොහෙද ගොම තියෙන්නේ? දිව්‍යලෝකය ඉතාම පිරිසිදු ලස්සන තැනක්. එහෙ තියෙන්නේ ලස්සන දේවල්. මිනිස්සු දිව්‍යලෝකයට යන්න පින් කරන්න ඕනි. මට පුළුවන් ඔයාවත් එක්කගෙන යන්න. ඒ නිසා වහාම යමු" කියලා ඔහු කිව්වා.

පනුවෙක් වෙලා ඉපදුන යාලුවා එතකොට කියනවා "මම ආස ගොම වලටයි මට ජීවත් වෙලා පුරුදු මේ ගොම ගොඩෙයි. මම දිව්‍යලෝකේ ගිහිල්ලා මොකටද, එහෙ ගොම නැත්නම්" කියලා.

මේක අහන අපිට නම් පුදුම හිතෙනවා. ඇයි මේ ජරා ගොම අතඇරලා අර ලස්සන දිව්‍යලෝකයට යන්න අකමැති කියලා. නමුත් පුදුම වීම නෙවෙයි සිද්ධවිය යුත්තේ තේරුම් ගැනීමයි.

**පළමුවන තේරුම් ගැනීම තමයි, මිනිස්සු සිද්ධීන් දිහා බලන විදිය එකිනෙකාට වෙනස්. සිද්ධීන් තේරුම් ගැනීම එකිනෙකට වෙනස්. එකම සිද්ධිය සම්බන්ධයෙන් කරන නිර්වචනය අනිත් කෙනාට වඩා වෙනස්.** මෙම වෙනස් වූ නිර්වචන හරහා එම සිද්ධීන් වලට, අවස්ථා වලට දෙන අර්ථකතනයන් වෙනස් වෙනවා. මේ නිසා එම සිද්ධීන්, අවස්ථා වලට දක්වන ප්‍රතිචාර්ය (හැසිරීම) එකිනෙකට වෙනස් වෙනවා. ඒ නිසා අවසානයේ ඒ ඒ කෙනාට ලැබෙන ප්‍රතිඵලය වෙනස් වෙනවා.

පංච ඉන්ද්‍රියන් හරහා අවට පරිසරයෙන්, සිදුවීම් වලින් විස්තර ලබාගන්න අපි, එම සිදුවීම් වලට වෙනස් විදියේ නිර්වචන, තේරුම් දෙන්නේ ඇයි?